මගේඅංකය 8/3/1
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය
ගිරිතලේ ව්‍යාපාරය
ජයන්තිපුර
2019.03.12

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියලුම
සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>2019 මාර්තු මස ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා 2019 යල විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටු වර්තාව (පෙර කන්න රැස්වීම)</u>**

2019 මාර්තු මස 11 වන දින පෙ.ව. 9.30 ට ගිරිතලේ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාවේදී මාර්තු මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම හා 2019 යල කන්නය සඳහා පෙරකන්න රැස්වීම පවත්වන ලදි. පැමිණ සිටි සියලු දෙනා නේවාසික ව්‍යාපෘති කළමනාකාරතුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් පසු න්‍යාය පත්‍රයට සභාවට ඉදිරිපත් කර සාකච්ඡාවට ගත යුතු වෙනත් කරුණු තිබේදැයි විමසන ලදි

**<u>සහභාගි වූ නිළධාරින්</u>**

| | |
|---|---|
| ඩබ්.ඒ.එස්. ප්‍රියන්ත | නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ගිරිතලේ |
| ඒ.එම්.ඒ.අයි.බී.අබේසිංහ | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - මින්නේරිය |
| ආර්.එම්.එස්.සී. කුමාර | ඉංජිනේරු සහකාර - ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය, මින්නේරිය |
| සී.එම්.ටී.ඩී.බී.චන්ද්‍රසේකර | ඉංජිනේරු සහකාර - ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය, මින්නේරිය |
| එම්.ඩී.ජී.පී.වීරසිංහ | ඉංජිනේරු සහකාර - ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය, මින්නේරිය |
| පී.ජේ.ආර්.පී. ජයවික්‍රම | ආයතන සංවර්ධන නිළධාරී - ගිරිතලේ |
| ටී.එම්.සී.කුලතුංග | සංවර්ධන නිළධාරි - ගිරිතලේ |
| ඩබ්.ඒ.ජී.විජේසිංහ | සංවර්ධන නිළධාරි -වාරිමාර්ග කාර්යාලය, මින්නේරිය |
| අයි.අයි.පී.කේ.අමරසූරිය | ස්ථානභාර කෘෂිකර්ම උපදේශක -නවනගරය |
| ඩී.ජී.ස්වර්ණා කුමාරි | ස්ථානභාර කෘෂිකර්ම උපදේශක -,ගිරිතලේ |
| ආර්.ඒ.නදීෂා සංජීවනි | කෘෂිකර්ම උපදේශක,නවනගරය |
| එම්.පී.එස්.ඩී.එස්.ලංකාථ් | කෘෂිකර්ම උපදේශක,ගිරිතලේ |
| ආර්.ජී.ඉන්ද්‍රානි සිරියලතා | කෘ ප. නි. ස., ගොවිජන සේවා මධ්‍යස්ථානය,ගිරිතලේ |
| ආර්.ආර්.ජී.සී.සරත්චන්ද්‍ර | තාක්ෂණික සහයක, කෘ.උ.කා. ගිරිතලේ |
| ඩබ්.ජී.එස්.එස්.කේ.නන්දසිරි | කෘ ප. නි. ස., ගොවිජන සේවා මධ්‍යස්ථානය, නවනගරය |

**<u>සහභාගි වූ ගොවි නියෝජිතයින්</u>**

| | |
|---|---|
| ඒ. අසීස් | සභාපති, පුරාණ මුස්ලිම්ගම බෙදුම්ඇල ගොවි සංවිධානය |
| ඩබ්.ඒ. පොඩි රාළහාමි | සභාපති, පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.එම්. දයාවංශ | සභාපති, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.ඒ.රූපසිංහ | සභාපති, පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජී.එම්. සෝමරත්න මල්ලව | සභාපති, විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.එම්. රණතුංග බංඩා | සභාපති, පැරණි ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| බී.එම්. රංජිත් බණ්ඩාර | සභාපති, නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එම්.ජී. කුමාර රූපසිංහ | සභාපති, ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජී.එම්. ආනන්ද වික්‍රමසූරිය | සභාපති, උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.ඒ.ඩී. ශාන්ත ගුණසේකර | සභාපති, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| පී.ආර්.ජයරත්න | සභාපති, 48 බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජී.ජී.සෝමරත්න | සභාපති, චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.ආර්.එම්. අබේරත්න බංඩාර | සභාපති, මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.එම්. ජයවර්ධන බංඩා | ලේකම්, අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.එච්.එම්.එස්. විජේසුන්දර | ලේකම්, පුරාණ ගිරිතලේගම බෙදුම්ඇල ගොවි සංවිධානය |
| ඩී.එම්.පුංචිබංඩාර | ලේකම්, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.එම්.ජේ. දිසානායක | ලේකම්, ජයන්තිපුර බෙදුම්ඇල ගොවි සංවිධානය |
| ඩී.එච්.එම්. සිසිර බංඩාර | ලේකම්, නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.එම්.පී. රත්නායක | ලේකම්, විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජී.සී.කේ.හේරත් | ලේකම්, පැරණි ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්. සෙනෙවිරත්න | භාණ්ඩාගාරික, ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එල්. ශ්‍රියානි ධම්මිකා | භාණ්ඩාගාරික, පැරණි ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.ඩබ්. හෙට්ටිවත්ත | භාණ්ඩාගාරික, පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.එම්.මානෙල් පෙරේරා | භාණ්ඩාගාරික, මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය |

| | |
|---|---|
| යූ.එච්. මුදියන්සේ | භාණ්ඩාගාරික, විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.කේ. ඉන්දික පුෂ්පකුමාර | භාණ්ඩාගාරික, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| පි.එම්.ආර්.පොඩිබංඩා | උ.සභාපති, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩි.එම්.පාලිත | කාරක සභික, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩි.ඩි.වීරවංශ | උපදේශක, ව්‍යා.ගොවි සංවිධානය |

**<u>සහභාගි නොවූ ගොවි නියෝජිතයින්</u>**

| | |
|---|---|
| චන්ද්‍රසේන පෙතියාගොඩ | සභාපති, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.ඒ. නිමල් රූපසිංහ | සභාපති, අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.ඩී.සී. වික්‍රමාරච්චි | ලේකම්, උණගලාවෙහෙර බෙදුම්ඇල ගොවි සංවිධානය |
| එච්.ඒ. සිරිල් කරුණාරත්න | ලේකම්, සමගි බෙදුම්ඇල ගොවි සංවිධානය |
| ආර්.ජී.සිරිසේන | ලේකම්, මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ර්.ඩි.නිලන්ති එදිරිසිංහ | ලේකම්, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.ජී.ශිරෝමනි පෙරේරා | ලේකම්, චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඒ.ඒ.ඉමාදින් | ලේකම්, මුස්ලිම්ගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.එම්.විජේරත්න | ලේකම්, පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| වයි.ජී. සිරිවර්ධන | භාණ්ඩාගාරික, අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| කේ.වයි.ජී. චන්ද්‍රරත්න | භාණ්ඩාගාරික, පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.ඒ.ඩබ්. ලාල් හෙට්ටිආරච්චි | භාණ්ඩාගාරික, උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.ඒ.පොඩිබංඩාර | භාණ්ඩාගාරික, නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එම්.පි.එස්.සරත් කුමාරසිරි | භාණ්ඩාගාරික, චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජී.කේ.ජී. සරත් කුමාර | භාණ්ඩාගාරික, කඩවලවැවබෙදුම් ඇල ගොවි සංවිධානය |
| අයි.පි. ජයරත්න | භාණ්ඩාගාරික, 48 බෙදුම් ඇල ගොවි සංවිධානය |
| සාෆිර් | භාණ්ඩාගාරික, මුස්ලිම්ගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්. හින්නි මහත්තයා | භාණ්ඩාගාරික, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |

**<u>සහභාගි නොවූ රාජ්‍ය නිළධාරීන්</u>**

| | |
|---|---|
| එච්.පී.ජී.ඒ. ප්‍රියදර්ශනි මැදඇල | ප්‍රාදේශීය නිළධාරී, ගො.සේ. මධ්‍යස්ථානය, ගිරිතලේ |
| ඒ.ආර්.ආර්.එන්.කේ. අලහකෝන් | ප්‍රාදේශීය නිළධාරී, ගො.සේ. මධ්‍යස්ථානය, නවනගරය |

**01.ලිපි ඉදිරිපත් කිරීම**

**<u>නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ඩබ්.ඒ.එස්. ප්‍රියන්ත</u>**

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිළධාරී - ගිරිතලේ | 2019.03.11 දින ගොවිජන අභිමන් තරග සදහා ත්‍යාග හා සහතිකපත් බෙදා දීමේ උත්සවය පවතින බැවින් ව්‍යාපාර කළමනාකරණ කමිටුවට හා පෙර කන්න රැස්වීමට සහභාගී වීමට නොහැකිවන බව | - | - |
| අධ්‍යක්ෂ, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | රක්ෂිත වෙන්කිරීමෙන් අනතුරුව රක්ෂිත සීමා තුළ පුවක් පැල සිටුවීම සදහා පුවක් පැල ලබා ගැනීම සදහා ඉදිරිපත් කරන ලද ලිපිය | ගොවි සංවිධාන තරගාවලියෙන් ජයග්‍රහනය කළ ගොවි සංවිධාන සදහා ලබා දෙන බව | - |
| අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය | අතිරේක ආහාර බෝග ආනයනය සීමා කිරීමට සහ අපනයනය කිරීමට අවශ්‍ය ඉල්ලුම් ඇති බෝග වාණිජ වශයෙන් වගා කිරීමට කඩිනමින් සැලැස්මක් පිළියෙල කර ගැනීම සදහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස | - | - |
| | ඵලදායීතා ප්‍රවර්ධනය හා වාරිමාර්ග කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති අනුමැතිය සදහා යොමු කිරීමට පෙර ඒ සෑම උප ව්‍යාපෘතියක්ම අදාල ගොවි සංවිධානයේ රැස්වීමකදී ඉදිරිපත් කර එකගතාව ලබා ගත යුතු බව(කාර්ය නිශ්චය කිරීම | එම එකගතාව වාර්තා කර එහි පිටපත සමග උප ව්‍යාපෘතිය සෑම සංරචකයක් විසින්ම කලයුතු බව | |

| | | | |
|---|---|---|---|
| වාරිමාර්ග අධ්‍යක්ෂ, පොලොන්නරුව | වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පාලනය වන ප්‍රධාන වැව් 73 ක් මුල්කරගනිමින් 2015.03.15 දින ජල පිරිත් දේශනාවක් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර එය පොළොන්නරුව දිස්ත්‍රික්ය තුළද පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් සහයෝගය ලබා දෙන ලෙස | ගොවි සංවිධාන ඒ සඳහා සහය උපරිම සහයෝගය ලබා දෙන බව<br>දැනටමත් වගකීම බෙදා ඇති බවත් 15 වන දින එම ද්‍රව්‍ය කාර්යාලයට ලබා දෙනලෙසත් | ව්‍යාපාර කාර්.ගො.ස ං. |
| දත්ත කලමනාකරු, ගිරිතලේ ව්‍යාපාරය | ගොවි සංවිධානයක් මගින් මසකට ලබාදෙන රු. 800.00 දීමනාව රු 1500.00 දක්වා වැඩිකර දෙන ලෙස කරන ලද ඉල්ලීම | මුස්ලිම්ගම ගො.සං. ගරු සභාපතිතුමාගේ සහ 48 ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මසකට රු.1500.00 බැගින් දත්ත කළමනාකරුට ලබා දීමට තීරණය විය | ස්ථාවර නියෝග බැංකුවලට නිකුත් කිරීම, ව්‍යාපාර කාර්. |

**02.ආයතන සංවර්ධන කටයුතු**

| කාරණය | ප්‍රගතිය | වෙනත් |
|---|---|---|
| කාරක සභා පැවැත් වීම | 15 | - |
| කාරක සභා නොපැවැත්වූ සංවිධාන | - | - |
| බාහිරි විගණනය | 15 | - |

**<u>මෙම මාසයේදී පැවැත්වවීමට අපේක්ෂිත කාරක සභා</u>**

| කාරණය | ඉලක්කය | වගකීම |
|---|---|---|
| කාරක සභා හා 2019 යල සඳහා මහ සභා | 15 | ආයතන සංවර්ධන නිළධාරි,<br>සංවර්ධන නිළධාරි |

**<u>ආයතන සංවර්ධන නිළධාරී - පී.ජේ.ආර්. ප්‍රියදර්ශනී</u>**

- මුස්ලිම්ගම, අග්බෝපුර, චන්දනපොකුණ,48 බෙදුම් ඇල ගොවි සංවිධාන මාර්තු මාසය සඳහා මේ වනතුරුත් කාරක සභා පවත්වා නොමැති අතර මේ මස 15 වන දිනෙන් පසු 2019 යල කන්නය සඳහා ජලය නිකුත් කිරීමට මහසභා පැවැත්වීමට සිදුවන බැවින් කඩිනමින් මාසික කාරක සභා පවත්වා අවසන් කරන ලෙස
- මාසයට නියමිත කාරක සභා නොපවත්වා, කාරක සභාව පැවති බවට ව්‍යාජ වාර්තා ඉදිරිපත් කරන ගොවි සංවිධාන ඇති බව
- ගොවි සංවිධාන තරගාවලිය සඳහා සුදුසුකම් ලද ගොවි සංවිධාන ඒ සඳහා සූදානම් විය යුතු බව
- අනිකුත් ව්‍යාපාර ගොවි සංවිධාන මට්ටමින් පවත්වන ලද තරගාවලියේ ප්‍රතිඵල ප්‍රධාන කාර්යාලයට නිකුත් කර නොමැති වීම හේතුවෙන් තරගාවලිය මෙලෙස කල් යාමට හේතු වූ බවත් ඉදිරි කාලය ගොවි මහතුන්ට කාර්ය බහුල කාලයක් වන බැවින් මාර්තු හා අප්‍රේල් මාස අවසන් වන තුරු ගොවි සංවිධාන දිස්ත්‍රික් තරගාවලිය සඳහා ඉදිරිපත් විමට අපහසු බව ගොවි සංවිධාන දන්වා ඇති බවත් ඒ පිළිබද ප්‍රධාන කාර්යාලය දැනුවත් කිරීමට කටයුතු සිදුකරන බව
- 2019 වර්ෂයට අදාල නිළවරණ ජූනි. ජූලි මාසය වන විට පැවැත්වීමට කටයුතු සිදුකළ යුතු බවත් ඒ සඳහා කෙත් ඇල මට්ටමින් කෙත් ඇල නියෝජිතයින් පත් කළ යුතු බවත්
- කෙත් ඇල පත් කිරීමට පෙර ගොවි සංවිධානය සතු සාමාජික නාම ලේඛනය නිවැරදිව සකස් කළ යුතු බව
- විගණන වාර්තා මේ වනවිට සකස් කර අවසන් බව
- පිරිත් පිංකම වෙනුවෙන් පිරිකර මිලට ගැනීම සඳහා මුදල් නොගෙවූ ගොවි සංවිධාන මුදල් ගෙවා අවසන් කළ යුතු බව
- පිරිත සඳහා ගොවි සංවිධාන මගින් භාරගත් අනිකුත් ද්‍රව්‍ය 2015.03.15 වන දින උදේ නේවාසික ව්‍යාපෘති කාර්යාලයට ලබා දිය යුතු බව
- ගොවි සංවිධාන නිලවරණ අවසන් වූ සැනින් ඒකබාද්ධ ගොවි සංවිධානයේ නිලවරණයට සූදානම් විය යුතු බව

**<u>නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ඩබ්.ඒ.එස්. ප්‍රියන්ත</u>**

- මාසයට නියමිත කාරක සභා නිවැරදි පවත්වා ගොවි සංවිධාන ශක්තිමත් කර ගැනීම ගොවි සංවිධානය සතු වගකීමක් බවත් ඒ සදහා ව්‍යාපාර කාර්යාලයේ නිළධාරීන් නිවැරදිව යොමු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති බව
- ගොවි සංවිධාන තරගාවලිය සදහා අදාල ගොවි සංවිධාන ඒ සදහා සූදානමින් සිටිය යතු බවත්
- ඉදිරි කාලය ගොවි මහතුන්ගේ අස්වනු නෙලන කාලය බැවන් එම කාලය තරගාවලිය සදහා සුදුසු නොවන බව ප්‍රධාන කාර්යාලයට දැනුම් දීමට කටයුතු යොදන බව
- විගණන වාර්තා සකස් කර අවසන් වන බැවින් එහි ඇති අඩුපාඩු පෙන්වා දිය හැකි බවත්
- ගොවි සංවිධාන විගණනව ඉතාම නිවැරදිව වියයුතු බැවින් 2020 සදහා අවශ්‍ය නම් වෙනත් විගණන කරුවෙකු තෝරා ගත හැකි බව
- 2019 ජුනි, ජුලි මාස වන විට ගොවි සංවිධාන වල නිළවරණ පවත්වා අවසන් කළ යුතු බව
- 2019 සැප්තැම්බර් මාසය වන විට ඒකාබද්ධ ව්‍යාපාර ගොවි සංවිධානයේ නිළවරණය පවත්වා අවසන් කළ යුතු බව
- රාජ්‍ය විරෝධී කාර්යයන් පැවැත්වීම සංවිධානය කිරිම සදහා රාජ්‍ය ආයතන සෘජුව හෝ වක්‍රව උදව් කිරීමට නොහැකි බවත් එය හොදින් තේරුම්ගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

**<u>උපදේශක - ව්‍යාපාරගොවි සංවිධානය</u>**

- ගොවි සංවිධාන වලට ඉතා සමීප සම්බන්ධතාවයක් පවත්වාගනිමින් නේවාසික ව්‍යාපාර කාර්යාලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කරන බව
- වාරිමාර්ග කළමනාකරණ අංශය වසා දැමීමට තීරණය වූ අවස්ථාවේ ඒ සදහා ගොවි සංවිධාන වාරිමාර්ග කළමනකරණ අංශයට සහය දැක්වූ බව
- වාරිමාර්ග කළමානකරණ අංශය යම් යම් අවස්ථා වල ගොවි සංවිධාන බිද දැමීමට උත්සහ කරන බව
- රාජ්‍ය නිළධාරීන් ගොවි මහතුන්ගේ අපහසුතා පිළිබද කතා කිරීම ඉතා අඩු බව
- එදා සහ අද වී මිල සහ සහල් මිල අතර වෙනස පිළබදව තමා කනගාටු වන බව
- ගොවීන් අතර එකමුතු බව අඩුකම
- 2017 මාර්තු 08 උද්ඝෝෂණය පාවා දුන්නේ ගොවි නායකයින් කිහිපදෙනෙකු බවත් ලැබෙන තොරතුරු නිවැරදිව තේරුම් ගත යුතු බවත්

**<u>නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ඩබ්.ඒ.එස්. ප්‍රියන්ත</u>**

- වාරිමාර්ග කළමනාකරණ අංශය ගොවි සංවිධාන බිද දැමීමට නොව ශක්තිමත් කිරීමට සහය ලබා දෙන බව
- ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය බිහිවීමට අඩිතාලම ලබා දුන්නේද වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් බව
- කන්තලේ ජයන්ත චන්ද්‍රසේකර, ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරයා අවස්ථා තුනක් සාකච්ඡාවට ඉල්ලා ඇති බවත් ඒ සදහා ඉඩ ජාතික ගොවි සංවිධානය ලබා දී නොමැති බව
- උද්ඝෝෂනය කළ යුතු පියවරයන් අනුගමනය නොකර ක්‍රියා කිරීම
- 2017 මාර්තු 8 ක්‍රියාමාර්ග පාවා දී තිබුනේ කාර්යාල නොව ගොවි නායකයින් බව

**03. නඩත්තු/මෙහෙයුම් කටයුතු**
**<u>2019 යල කන්නය සඳහා දෙපාර්තමේන්තු නිර්දේශ</u>**

**<u>ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - මින්නේරිය</u>**

- 2019.03.11 වන විට ජලාශයේ ජල තත්වය අ.අඩි 11557 ක ධාරිතාවයක පවතින බවත්
- මහවැලි ජල පාලන කමිටුවට ජලය ලබා ගැනීම සදහා ඉල්ලීම් සිදු කර ඇති බව
- 2019 යල කන්නය සඳහා වැවේ ජල ධාරිතාවය ප්‍රශ්නයක් නොවන බව
- කන්නය කලින් වැඩ ආරම්භ කිරීමට එළඹෙන 2019 යල කන්නය හොද අවස්ථාවක් කර ගත හැකි බව
- ඉදිරි කාලය පිළිබද සිතා ජලය අපතේ නොහැරෙන ලෙස යල කන්නය සඳහා දින නියම කරගත යුතු බව
- මෙම 2018/19 මහ කන්නය සඳහා වැඩිපුර ජල මුර ලබාදීම අවශ්‍ය නොවන බවත් කන්න තීරණ වලට අනුව කටයුතු සිදු කරන බව
- ඩී -07 බෙදුම් ඇලේ ඉතිරි වැඩ ආරම්භ කිරීම සදහා මාර්තු 17 දින ඇල වසා දිය යුතු බව

**04. සැපයුම් හා සේවා සම්පාදනය**
**<u>ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - නව නගරය</u>**

- ඉදිරි කන්නයේදීත් පළිබෝධ උවදුරු පිළිබද අවධානය යොමු කළ යුතු බව
- 2019 යල් කන්නය සඳහා මැයි මස 15 වන විට වගාව පිහිටුවා අවසන් කිරීම සුදුසු බවත්
- වැපිරීමට දින 20 කට පෙර මුල්ම බිම් සැකසීම සිදුකළ යුතු බවත්
- ලොයෙන්ට් කෘෂි රසායනය සම්බා වී සදහා සුදුසු නොවන බවත් එමගින් ගොවිතැනට හානි වූ ගොවි මහතුන්ගේ නාම ලේඛන අදාල ආයතනවලට ලබා දී ඇති බව
- සී.අයි.සී. සමාගම හානි වූ අස්වැන්නට වන්දි ලබා දෙන බව සදහන් කර ඇති බව
- අලුතින් කෘෂි රසායන වෙළඳපලට හදුන්වාදීමේදී ගොවි මහතුන් යම් සීමිත ප්‍රමාණයකින් අත්හදා බැලීම වඩාත් සුදුසු බව
- එම රසායනය සම්බන්ධව මේ වනවිට අත්හදා බැලීම් සිදුකරමින් පවතින් බව

**<u>ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - ගිරිතලේ</u>**

- 2019 යල කන්නය සඳහා මේ වනතෙක් අතිරේක ආහාර බොග සඳහා ව්‍යාපෘති ලැබී නොමැති බව

- අතිරේක ආහාර බෝග වගාව සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණය ලබා ගැනීම සඳහා ඒ ඒ ගොවි සංවිධාන මගින් අවශ්‍ය ප්‍රමාණ ලැයිස්තුගත් කර කන්න රැස්වීම් දින ලබාදෙන ලෙස

**<u>ගරු සභාපති - කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය</u>**

- 2019 යල කන්න රැස්වීම සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ අනිවාර්යෙන්ම සහභාගී කරවීමට කටයුතු සලසා දෙන ලෙස
- එළබෙන කන්නය යල කන්නයක් වන බැවින් ගොවි මහතුන්ට අතිරේක බෝග බීජ අවශ්‍ය වන බවත් ගොවි මහතුන් වැඩිවශයෙන් අතිරේක බෝග වගාවට යොමු කිරීම සුදුසු බවත්
- කන්න රැස්වීමට සහ ව්‍යාපාර කමිටුවට පැමිණෙන විවිධ කෘෂි රසායන වෙළඳ නියෝජිත මහතුන්ට විරෝධය දක්වන බව
- අමතර ජල මුර ලබා දීමට තමන් අකමැති වන බවත්
- කොන්ත්‍රාත්කරුවන් සඳහා 17 දින ජලය නවතා වැඩ ආරම්භ කිරීමට ඉඩ සලසා දිය යුතු බවත්
- ලොයෙන්ට් තෙල් භාවිත කළ ගොයම දින බාල වූ නිසා එම ගොවිමහතුන් ගැන සිතා එම හානි වූ ප්‍රමාණය 25% කට වඩා වැඩි නම් අමතර ජල මුරයක් ලබා දීම සුදුසු බව
- මෙම කන්නයේ අස්වැන්න නෙලීමට යන්ත්‍ර සූත්‍රවල හිඟතාවක් පවතින බැවින් අස්වනු නෙලීම ප්‍රමාද වන බව
- බිත්තර වී සකසා ගැනීමට පොඩි කාලයක් අවශ්‍ය බව
- ඒ නිසා 2019 යල කන්නය සඳහා ජලය ලබා දීම අප්‍රේල් 15 වන දින සුදුසු බවත්
- දින 20 ක් බිම් සැකසීම සඳහා සුදුසු වන බවත් එබැවින් මැයි මස 5 වෙනි දින මුර ජලය ලබාදීම ආරම්භ කිරීම සුදුසු බවත්

**<u>ගරු සභාපති - පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය</u>**

- 2019 යල කන්නය සඳහා අප්‍රේල් 15 වන දින ජලය නිකුත් කිරීම සුදුසු බව
- අස්වනු නෙලීම ආරම්භ වී ඇති නිසා අමතර ජල මුර ලබා දීමෙන් අස්වනු නෙලීමට අපහසු බව

**<u>ගරු සභාපති - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය</u>**

- ලොයෙන්ට් තෙල් යෙදූ සීමිත ගොවි මහතුන් පිරිසකගේ ගොයම බාල වී ඇති බවත් එබැවින් මාර්තු 17 වන දින අවසන් වීමට නියමිත ජල මුරය 20 වනදා තුරු ලබා දෙන ලෙසත්
- කන්න තීරණ වලට අනුව වැඩිපුර ජල මුර සඳහා අක්කරයකට රු. 500/- ක දඩය ලබාදීමට තම ගොවි සංවිධානය එකඟ බව
- පළිබෝධනාශක පනත යටතේ කෘෂි රසායන ගොවි මහතුන් අතට පත්වන්නේ කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත බැවින් ලෝයෙන්ට් තෙල් සඳහා වූ බලපෑමේ වගකීම භාර ගැනී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නොහැකිද යන්න

**<u>ගරු සභාපති - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය</u>**

- කන්න තීරණ වලට අනුව ගොවි මහතුන් වගාව ස්ථාපනය කරන්නේ නම් ජලය පිළිබඳ ගැටළු ඇති නොවන බව

**<u>ගරු ලේකම් - විජය බෙදුම් ඇල ගොවි සංවිධානය</u>**

- මේ වනවිට 95% පමණ අස්වනු පැසී ඇති බවත්
- ලෝයෙන්ට් තෙල් යෙදූ ගොයමද කහ පැහැ ගැන්වී ඇති බවත්
- අමතර ජල මුර අවශ්‍ය නොවන බව

**<u>ගරු ලේකම් - කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය</u>**

- 25% පමණ ජලය ලබා දීම ප්‍රමාණවත් බව
- ලොයෙන්ට් තෙල් සම්බා ගොයමට මෙන්ම නාඩු ගොයමට ද අහිතරකර ලෙස බලපාන බව
- කෘෂි කර්ම දෙපාර්තමේන්තුවට ලොයෙන්ට් සම්බන්ධව වගකීම භාරගත නොහැකිද යන්න පිළිබඳ

**<u>ගරු සභාපති - මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය</u>**

- කන්න තීරණ වලට අනුව ගොවි මහතුන් වගාව ස්ථාපනය කරන්නේ නම් ජලය පිළිබඳ ගැටළු ඇති නොවන බව
- කන්න තීරණ වලට අනුව වැඩ කිරීම සුදුසු වන බව

**<u>නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ඩබ්.ඒ.එස්. ප්‍රියන්ත</u>**

- නියමිත දිනට වගාව අවසන් කළ ගොවි මහතා ආරක්ෂා කිරීමට ප්‍රධාන කාර්ය බව
- මාර්තු 17 දිනෙන් පසු නැවත ජල මුර නිකුත් නොකරන බව
- මාර්තු 17 දිනෙන් පසුත් ජලය අවශ්‍ය ගොවි සංවිධාන ඇත්නම් දිස්ත්‍රික් ලේකම්තුමා හමුවී සාකච්ඡා කරන ලෙස වගාවෙන් 25% කට වැඩිය තිබෙන බව සනාථ කිරීමේ තොරතුරු ද රැගෙන යන ලෙස
- 2019 යල කන්නයට පෙර කිරිඉතිරවීමේ උත්සවය අප්‍රේල් 15 දිනට පෙර යොදා ගැනීම සුදුසු බව

**<u>2019 යල පෙර කන්න රැස්වීම් තීන්දු තීරණ</u>**

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් සංශෝධිත 1968 අංක 48 දරණ වාරිමාර්ග ආඥා පනතේ විදිවිධාන අනුව 2019.03.11 වන දින ගිරිතලේ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල රැස්වීම් ශාලාවේ පැවති ගිරිතලේ මහා වාරිමාර්ග බල ප්‍රදේශයේ 2019 යල පෙර කන්න වගා රැස්වීමේදී පහත තීරණ වලට එළඹෙන ලදි.

| | වගා කරන බෝග වර්ගය | වී හා අතිරේක බෝග |
|---|---|---|
| | වගා කරන බිම් ප්‍රමාණය (රක්ෂිත හා ගොඩ ඉඩම් හැර) හෙක්ටයාර් | 2617 |
| 01. | ගොවින් විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.04.08 |
| 02. | ගොවි සංවිධාන විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.04.10 |
| 03. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන ඇල නඩත්තු වැඩ අවසන් කළ යුතු දිනය | 2019.04.10 |
| 04. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | 2019.04.15 |
| 05. | වගාව පිහිටවා අවසන් කළ යුතු දිනය | 2019.05.10 |
| 06. | මුර ජලය ආරම්භ කරන දිනය | 2019.05.13 |
| 07. | ට්‍රැක්ටර් හා ගවයන් යායෙන් ඉවත් කළ යුතු දිනය | 2019.05.10 |
| 08. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2019.05.10 |
| 09. | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2019.08.21 |
| 10. | අවසන් වරට මුර ජලය නිකුත් කරන දිනය | 2019.08.09 |

1968 අංක 48 වාරිමාර්ග පනතේ 11 වන වගන්තියේ 1 හා 2 උප වගන්ති අනුව කන්නයට අදාළව සකස් කර ගන්නා රීති

01. වාරි ජලය ලබාගෙන දුම්කොළ වගා කිරිම සපුරා තහනම්.
02. ගොවි සංවිධාන නඩත්තු අරමුදල සදහා වගා කරනු ලබන සෑම අක්කර 1 ක් සදහාම රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය. එම මුදල ගොවි සංවිධානයේ නඩත්තු හා මෙහෙයුම් අරමුදලට බැර කළ යුතුය.
03. නියමිත දිනට බෙදුම් ඇල සහ කෙත් ඇල ශුද්ද නොකරන ගොවින්ගෙන් එම ඇල වේලි ශුද්ධ කිරීම සදහා බඹයකට රු. 250.00 ක මුදලක් අය කර ගැනීමට ගොවි සංවිධානයට අවසර දෙනු ලැබේ.
04. කන්නය තුළ දෙවතාවක් බෙදුම් ඇල හා කෙත් ඇල ඇලවේලි ශුද්ධ කිරීම අනිවාර්ය වේ.( කන්නය ආරම්භයේ සහ වගාව පිහිටුවා දින 45 න් පසු)
05. ගවයන් සහ ට්‍රැක්ටර් වාරිමාර්ග ඇලට ඇතුළු කිරීම සපුරා තහනම් වන අතර එසේ කළහොත් හානි වන ඇල වල් සහ නිර්මිත සදහා වාරිමාර්ග ඉංජිනේරුගේ තක්සේරු මුදල ගොවි සංවිධානය විසින් අය කරනු ලැබේ.
06. ඇලවේලි/නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංග වලට හානි කරන පුද්ගලයින් නීතිය ඉදිරියට පැමිණවීමට වාරිමාර්ග ආඥා පනතේ 23 වන වන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලයපවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වනවගන්තිය අනුව වැරදිකර්වන්ට මහේස්ත්‍රාත් අධිකරණයකදී කරනු ලබන ලඝු නඩු විභායකින් අනතුරුව දඬුවමට ලක්වනු ඇත.
07. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 84(1) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් දඬුවමට ලක්වනු ඇත.චූදිතයන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධාන නියෝජිතයන් හට බලය පවරණු ලැබේ.
08. ඇල සහ මාර්ග රක්ෂිත වගා කිරීම සපුරා තහනම්
09. අනවසරයෙන් බට දමා වාරි ජලය ලබා ගැනීම සපුරා තහනම්
10. නඩත්තු අරමුදල් නොගෙවන නිසි පරිදි ඇල වේලි ශුද්ධ නොකරන සාමාජිකත්වය ලබා නොමැති ගොවීන්ගේ පොහොර සහනාධාරය නිර්දේශ නොකිරීමට ගොවි සංවිධානයට හැකි වේ.
11. මෙම කන්න රැස්වීමේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියාකරන ගොවි නියෝජිතයන් හෝ ජල පාලකවරු රාජකාරියෙහි නියැලෙන විට බාධා

කිරීමක්, ඉඩ නොදීමක්, පරිබව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම අධිකරණයේ දී රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරු වේ. ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වන වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව නීතිමය ඊකවරණය සලසා ඇත.

12. අමතරව ජල මුරයක් ලබා දීම සඳහා ජලය ලබා ගන්නා ගොවි මහතුන්ගෙන් අක්කර 01 සඳහා රු 500/-ක මුදලක් අයකරන බවත්, ඒවන විට වගාවේ 25% පමණ තිබෙන බවට ගොවි සංවිධානය විසින් තහවුරු කිරීම
13. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වයක් හෝ කිසියම් පාලනය කළ නොහැකි බාහිර උපද්‍රවයන් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව සතු විය යුතු බව.
14. මෙම කන්න තීරණ සම්බන්ධයෙන් යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපණය කිරීමේ බලය පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් සතුය.

- පෙර කන්න රැස්වීමේ තීරණ යෝජනා කිරීම - එච්.ඒ.ඩී. ශාන්ත ගුණසේකර
  ගරු සභාපති, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය
- පෙර කන්න රැස්වීමේ තීරණ ස්ථිර කිරීම -පී.ආර්. ජයරත්න
  ගරු සභාපති, 48 බෙදුම් බෙදුම් ඇල ගොවි සංවිධානය

<u>**ඵලදායිතාවය ඉහළ නැංවීම වාරි පද්ධතිය කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (Peiseip)**</u>

| ඉදිරිපත් කළ අය | කාරණය | තිරණය | වගකිම |
|---|---|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | නාගපොකුණ, විජය, කඩවලවැව, උණගලාවෙහෙර ගොවි සංවිධාන සඳහා අතිරේක ආහාර බොග බීජ ලබා දීමට කටවුතු යොදා ඇති බව | | කෘ.දෙපා. |
| වාරි කළමනාකරණ අංශය | උණගලාවෙහෙර, විජය, කඩවලවැව, නාගපොකුණ ගොවි සංවිධානවලට අදාල මූලික දත්ත සමීක්ෂණ වාර්තා සහ විජය, කඩවලවැව ඒකාබද්ධ ක්‍රියාත්මක සැලැස්ම මේ වනවිට අදාල ආයතනවලට භාර දී අවසන් බව | ව්‍යාපාර කමිටුව දැනුවත් කිරීම | වාරි.කළ.අං. ගො.සං |
| | 2019.03.12 සහ 13 දින වල මහසෙන්, සමගි ගොවි සංවිධානවල ඒකාබද්ධ ක්‍රියාත්මක සැලැස්ම සෑදීම සඳහා යෙදී තිබුනත් මුදල් නොලැබීම නිසා එය මැයි මාසය දක්වා කාලය දීර්ඝ වන බව | ව්‍යාපාර කමිටුව දැනුවත් කිරීම | වාරි.කළ.අං. |
| | බෙදුම් ඇල රක්ෂිත වෙන්කිරීම සඳහා රක්ෂිත කණු දැමීමට අදාල උප ව්‍යාපෘතිය සකස් කර අදාල ආයතනවලට යොමු කර ඇති බව | ව්‍යාපාර කමිටුව දැනුවත් කිරීම | වාරි.කළ.අං. ගො.සං |

- වෙනත්

| ඉදිරිපත් කළ අය | කාරණය | තිරණය | වගකිම |
|---|---|---|---|
| ගරු සභාපති කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය | 2019.03.15 දින ගිරිතලේ වැව ආශ්‍රිත පවත්වන පිරිත් පිංකම සඳහා පසුදා උදෑසන ආහාර සැපයීම ඒකාබද්ධ ගොවි සංවිධානයට පැවරී ඇති බව | ගොවි සංවිධාන මට්ටමින් සහාය ලබා දීම | ගො.සං |

2019.03.11 වන දින පැවති ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම සහ 2019 යල පෙර කන්න රැස්වීමට පැමිණි සියලු නිලධාරීන් හා ගොවි සංවිධාන වල නියෝජිතයන් හට නේවාසික ව්‍යාපෘති කළමනාකරු විසින් ස්තූතිය ප්‍රකාශ කරන ලදි.



ඩබ්.ඒ.එස්. ප්‍රියන්ත
නේවාසික ව්‍යාපෘති කළමනාකරු

පිටපත් :-

01. අධ්‍යක්ෂ : වාරිමාර්ග කළමනාකරණ අංශය - කා.දැ.පි.
02. අධ්‍යක්ෂ, ජල කළමනාකරණ : වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ - කා.දැ.පි.

අමාත්‍යාංශය

03. දිස්ත්‍රික් ලේකම් : පොළොන්නරුව - කා.දැ.පි.
04. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ : පොළොන්නරුව - කා.දැ.පි.
05. ප්‍රාදේශීය ලේකම් : හිඟුරක්ගොඩ/තමන්කඩුව - කා.දැ.පි.
06. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ : පොළොන්නරුව - කා.දැ.පි.
07. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ : පොළොන්නරුව - කා.දැ.පි.
08. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් : පොළොන්නරුව - කා.දැ.පි.
09. වාරිමාර්ග ඉංජිනේරු : මින්නේරිය - කා.දැ.පි.
10. ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරී : ගිරිතලේ/නවනගරය - කා.දැ.පි.
11. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක : ගිරිතලේ/නවනගරය - කා.දැ.පි.
12. සභාපති : ඒකාබද්ධ ගොවි සංවිධානය - කා.දැ.පි.